ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

පිරිපහදුව - සපුගස්කන්ද

ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප් පරිමාණය |
|---|---|---|
| සහකාර පිරිපහදු කාර්මික ශිල්පී (පෑස්සුම්කරු) | බී-3 | රු.107990 -134615<br>5×1275 :10×2025 |

පත්වීමේ ස්වභාවය - ස්ථිර පදනම

තනතුරට අදාළ සුදුසුකම්

1. i. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා සහතිකය හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පුහුණු වූ ශ්‍රේණියක අවුරුදු එකක (01) පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

ii. අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් ඇතුළුව විෂයන් 06 ක් සමත් වී තිබීම හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ

සහ

(අ) අවුරුදු 4-5 ක කාලයක විශේෂ ආධුනිකත්වයක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පුහුණු මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

(ආ) අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු හයක (06) පුහුණු මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතුය.

2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
3. වෘත්තීය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

කාර්ය ක්ෂේත්‍රය

1. කාබන් වානේ, ක්‍රෝම් - මොලිබ්ඩිනම් සහ අනෙකුත් මිශ්‍ර ලෝහ ද්‍රව්‍ය මත SMAW, GTAW,GMAW (MIG) සහ FCAW ක්‍රම භාවිතා කරමින් වෑල්ඩින් කාර්යයන් සිදු කිරීම.
2. 6G ස්ථානය ඇතුලුව විවිධ වෑල්ඩින් ඉරියව්වන්හි කාර්යයන් සිදු කිරීම.
3. ක්‍රියාවලි නල පද්ධති (Process Piping), තාප හුවමාරුකාරක (Heat Exchangers), පීඩන භාජන (Pressure Vessels), ගබඩා ටැංකි (Storage Tanks) සහ ව්‍යුහාත්මක සංරචක (Structural Components) වෑල්ඩින් කිරීම සහ අලුත්වැඩියා කිරීම.
4. ගෑස් කැපීම (Gas Cutting), ප්ලාස්මා කැපීම (Plasma Cutting), ග්‍රයින්ඩින් කිරීම (Grinding), ගවුජින් කිරීම (Gouging) සිදු කිරීම සහ අනෙකුත් නිෂ්පාදන (Fabrication) මෙවලම් ආරක්ෂිතව හා කාර්යක්ෂමව භාවිත කිරීම.
5. වෑල්ඩින් ක්‍රියාපටිපාටි පිරිවිතර (Weld Procedure Specifications - WPS), අයිසොමෙට්‍රික් චිත්‍ර (Isometric Drawings) සහ නල හා උපකරණ රූප සටහන් (Piping and Instrumentation Diagrams - P&IDs) කියවා නිවැරදිව අර්ථකථනය කිරීම.
6. වෑල්ඩින් ක්‍රමවේදයට අනුව නිසි ලෙස වෑල්ඩින් උපකරණ සකස් කිරීම, වෑල්ඩින් කිරීමට පෙර කොටස් එකලස් කිරීම සහ ටැක් වෑල්ඩින් (Tack Welding) සිදු කිරීම.
7. අවශ්‍යතාවය අනුව වෑල්ඩින් කිරීමට පෙර සහ වෑල්ඩින් කිරීමෙන් පසු සිදුකරන තාප ප්‍රතිකාර (Pre-Weld සහ Post-Weld Heat Treatment - PWHT) ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
8. සම්පූර්ණ කරන ලද වෑල්ඩින් සන්ධි දෘශ්‍ය පරීක්ෂාවට ලක් කිරීම සහ විනාශකාරී නොවන පරීක්ෂණ (Non-Destructive Examination - NDE) ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දීම.

9. ASME, API සහ AWS ඇතුළු අදාළ සියලුම කේත (Codes) සහ ප්‍රමිතීන් (Standards) අනුගමනය කිරීම
10. ඉලෙක්ට්‍රෝඩ (Electrodes) නිසි ලෙස හැසිරවීම, ගබඩා කිරීම සහ පරිභෝජන ද්‍රව්‍ය (Consumables) පාලනය කිරීමේ ක්‍රියාපටිපාටි පවත්වාගෙන යාම.
11. පිරිසිදු, ආරක්ෂිත සහ ක්‍රමවත් වැඩබිමක් පවත්වාගෙන යාම, වැල්ඩින් පරිභෝජන ද්‍රව්‍ය (Welding Consumables) සහ උපකරණ නිසි ලෙස ගබඩා කිරීම හා හැසිරවීම.
12. සෑම අවස්ථාවකම උණුසුම් වැඩ (Hot Work) අවසර පත්‍ර අවශ්‍යතා සහ පිරිපහදු ආරක්ෂක ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
13. ඉංජිනේරුවන්, පරීක්ෂකයින් සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කර, නියමිත කාලසටහනට හා පිරිවිතරයන්ට (Specifications) අනුව වැඩ සම්පූර්ණ කිරීම.

**අමතර ප්‍රතිලාභ**

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ සාත්තු නිවාස පහසුකම් ඇතුලුව නොමිලේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම්, යතුරුපැදි / ත්‍රීරෝද රථ ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත. සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

**<u>අයදුම්කිරීමේ පිළිවෙල</u>**

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුවේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර 2026.08.24 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට පරිබාහිරව යොමු කරන ලද අයදුම්පත් පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කළමනාකාර අධ්‍යක්ෂ**
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
අංක 609 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09

2026.08.10

මහි/එස්එන්